**උතුරු පළාතේ අභ්‍යන්තරිකව අවතැන් වී නැවත පදිංචි කරන ලද ජනතාවගේ ජීවනෝපාය ප්‍රතිස්ථාපනය කිරීම සඳහා පසු ගැටුම් ක්ෂණික සහාය ව්‍යාපෘතිය- 2013**

---

උතුරු පළාතේ අභ්‍යන්තරිකව අවතැන් වී නැවත පදිංචි කරන ලද ජනතාවගේ ජීවනෝපාය ප්‍රතිස්ථාපනය කිරීම සඳහා පසු ගැටුම් ක්ෂණික සහාය ව්‍යාපෘතියේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය ( ශ්‍රීලංර) සහ ආසියානු සංවර්ධන බැංකුව (ආසංබැ) අතර 2010 සැප්තැම්බර් 27 දින එළඹි අංක ජේඑෆ්පීආර් -9150 - එස්ආර්අයි දරන ප්‍රදාන ගිවිසුමේ 11 (අ) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු , අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

---

ප්‍රදාන ගිවිසුම අනුව , ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර යාපනය , කිලිනොච්චි , මුලතිව් , මන්නාරම හා වවුනියා දිස්ත්‍රික් ලේකම් කාර්යාල ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතන වේ. ව්‍යාපෘතියේ අරමුණ වන්නේ , උතුරු පළාතේ අභ්‍යන්තරිකව අවතැන් වී නැවත පදිංචි කරන ලද ජනතාව (IDP) සඳහා තාවකාලිකව ආදායම් ඉපැයීමේ අවස්ථා සැලසීම මඟින් ඔවුන්ගේ ජීවනෝපායයන් ප්‍රතිස්ථානය කිරීමයි. ප්‍රදාන ගිවිසුම අනුව ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය එජඩො මිලියන 2.79 ක් වන අතර එයින් එජඩො මිලියන 2.5 ක් එනම් ව්‍යාපෘතියේ මුළු පිරිවැයෙන් සියයට 89 ක් මූල්‍යායනය කිරීමට ආසියානු සංවර්ධන බැංකුව එකඟ වී තිබුණි. එජඩො මිලියන 0.15 ක් හා එජඩො මිලියන 0.14 ක් වන ඉතිරි කොටස සඳහා පිළිවෙලින් ශ්‍රී ලංකා රජය හා ව්‍යාපෘති ප්‍රජාව දායක වේ. ව්‍යාපෘතියේ මූලික කටයුතු 2010 ඔක්තෝබර් 26 දින ආරම්භ කර තිබුණු අතර ව්‍යාපෘති කාර්යයන් 2011 මැයි 01 දින ආරම්භ කර තිබුණි. ව්‍යාපෘති කාර්යයන් 2013 අප්‍රේල් 25 වන විට නිම කිරීමට සැලසුම් කර තිබුණි. කෙසේ වුවද ව්‍යාපෘතිය අවසන් කිරීමේ දිනය 2014 පෙබරවාරි 28 දක්වා දීර්ඝ කරන ලදි.

## 1.3 ව්‍යාපෘතියේ කාර්යයන්

---

ප්‍රදාන ගිවිසුම අනුව ව්‍යාපෘතිය සම්බන්ධයෙන් වූ කාර්යයන් සාරාංශ කර පහත දැක්වේ.

| | | |
|---|---|---|
| 'අ' සංරචකය | - | කුඹුරු වාරි මාර්ග ඇළවල් හා ග්‍රාමීය ප්‍රවේශ මාර්ග පුනරුත්ථාපනය හා නඩත්තු කිරීම |
| 'ආ' සංරචකය | - | ස්වයං රැකියා සඳහා නිපුණතා සංවර්ධනය හා කෘෂිකාර්මික ඵලදායිතාවය වැඩිදියුණු කිරීම |
| 'ඇ' සංරචකය | - | ව්‍යාපෘති පරිපාලනය , ක්‍රියාත්මක කිරීමේ සහාය , නියාමනය හා විගණනය |

## 1.4 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම කළමනාකරණයේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම , ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙන යාමත්,

යෝග්‍ය ගිණුම්කරණ ප්‍රතිපත්ති තෝරා ගැනීම සහ යොදා ගැනීමත් , අවස්ථාවෝචිතව සාධාරණ ලෙස ගිණුම්කරණ ඇස්තමේන්තු සකස් කිරීමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 2. විගණන විෂය පථය සහ මතය සඳහා පදනම

-------------------------------------------------

මාගේ විගණන පරීක්ෂණ මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මෙම වාර්තාවේ ඇතුළත් විගණන මතය , අදහස් දැක්වීම් සහ සොයා ගැනීම් , විගණනය සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය සහ පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය , මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් සහ කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළහැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි. මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව විගණනය සිදුකරන ලදී. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන සාක්ෂි නියැදි පදනම මත පරීක්ෂා කිරීම් , මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති හා වැදගත් ඇස්තමේන්තු සහ මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. මාගේ උපරිම දැනීම සහ විශ්වාසය පරිදි විගණන කටයුතු සඳහා අවශ්‍ය වන ප්‍රමාණවත් තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලදි. ඒ අනුව මාගේ මතය සඳහා ප්‍රමාණවත් පදනමක් මාගේ විගණනය මගින් සපයන බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීම පිණිස අවශ්‍ය යැයි සලකනු ලැබූ පද්ධති හා පාලන , ගනුදෙනු , වත්කම්, වගකීම් හා ගිණුම් වාර්තා පිළිබඳ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් හා ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතුවලට අදාළ පොත්පත්, වාර්තා ආදියේ විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති හා පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) ශ්‍රී ලංකා රජයෙන් සහ අරමුදල් සපයනු ලබන නියෝජිතායතනයෙන් ලද අරමුදල්වලින් ව්‍යාපෘතිය වෙනුවෙන් දරන ලද වියදම , මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතුවලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ප්‍රදාන යටතේ මිලදී ගැනීම් හඳුනා ගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඇ) ප්‍රදාන යටතේ ආපසු ගැනීම් ප්‍රදාන ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුණේද යන බව.

(ඈ) ප්‍රදාන යටතේ සපයන ලද අරමුදල් , ද්‍රව්‍ය හා උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(ඉ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරිම සඳහා යොදා ගන්නා ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදිව හඳුනාගෙන තිබුණේද යන බව.

(ඊ) පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම පදනම් කර ගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව.

(උ) අග්‍රිම අරමුදල් ගිණුමේ ආරම්භක හා අවසාන ශේෂ , එම ගිණුමෙන් ආපසු ගැනීම් හා එම ගිණුමට ඌනපූර්ණය කිරීම් ව්‍යාපෘතිය විසින් පවත්වා තිබුණු පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණේද යන බව සහ 2013 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ (ශ්‍රීලංමබැ) ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(ඌ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව,

(එ) ප්‍රදාන ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වුයේද යන බව.

**3. මතය**

**------**

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව සහ මෙම වාර්තාවේ 5 ඡේදයේ දැක්වෙන කරුණුවලින් උද්ගත වන ගැලපීම්වලින් ඇතිවන බලපෑම් හැර, මාගේ මතය වනුයේ ,

(අ) 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව 2013 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) ප්‍රදාන ගිවිසුමෙහි දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණය සඳහා වූ ඉල්ලුම්පත්‍ර සනාථ කිරිම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (වි.ප්‍ර.) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව,

(ඈ) අග්‍රිම අරමුදල් ගිණුමේ ආරම්භක හා අවසාන ශේෂ, 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය තුළ එම ගිණුමෙන් ආපසු ගැනීම් සහ එම ගිණුමට ඌනපුරණය කිරීම් ව්‍යාපෘතිය විසින් පවත්වා ගනු ලැබූ පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණු බව සහ 2013 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණු බව, සහ

(ඉ) ප්‍රදාන ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතින්වලට අනුකූල වී ඇති බවත්ය.

**4. මූල්‍ය ප්‍රකාශන**

**----------------**

**4.1 මූල්‍ය කාර්ය සාධනය**

**-----------------------**

මූල්‍ය ප්‍රකාශන සහ ලබාගත හැකිවූ තොරතුරු අනුව, 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘති වියදම රු.148,175,255 ක් වූ අතර 2013 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම රු.297,370,880 ක් විය. සමාලෝචිත වර්ෂය සඳහා ව්‍යාපෘති වියදම, ඉකුත් වර්ෂය සඳහා වියදම හා 2013 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම පිළිබඳ සාරාංශයක් පහත දැක්වේ.

| වියදම් විෂයය | දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වියදම | | 2013 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම |
|---|---|---|---|
| | 2013 | 2012 | |
| | රු. | රු. | රු. |
| සිවිල් වැඩ | 79,243,900 | 125,549,800 | 205,208,400 |
| උපකරණ , ගොඩනැඟිලි ද්‍රව්‍ය භාණ්ඩ සහ ද්‍රව්‍ය | 43,650,405 | 8,294,715 | 52,420,479 |
| නිපුණතා පුහුණුව , වැඩ මුළු හා ප්‍රසිද්ධ ප්‍රචාරණ | 8,095,652 | 59,625 | 9,097,929 |
| ව්‍යාපෘති කළමනාකරණය | 17,185,298 | 8,943,310 | 30,644,072 |
| | 148,175,255 | 142,847,450 | 297,370,880 |

## 4.2 අග්‍රිම අරමුදල් ගිණුම

මුල්‍ය ප්‍රකාශන හා ලබාගත හැකිවූ තොරතුරු අනුව, 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අග්‍රිම අරමුදල් ගිණුමේ මෙහෙයුම් හා එම දිනට ගිණුමේ පැවති ශේෂය සාරාංශ කර පහත දැක්වේ.

| | එජඩො | රු. |
|---|---|---|
| 2013 ජනවාරි 01 දිනට ශේෂය | 83,685.67 | 10,641,537 |
| එකතු කළා :- ඌන පූර්ණයන් | 1,109,279.67 | 143,826,211 |
| විදේශ විනිමය වාසිය | - | 321,370 |
| | 1,192,965.34 | 154,789,118 |
| අඩු කළා - ආපසු ගැනීම් | 1,048,198.42 | 135,860,409 |
| 2013 දෙසැම්බර් 31 දිනට ශේෂය | 144,766.92 | 18,928,709 |

## 5. විගණන නිරීක්ෂණ

## 5.1 ගිණුම්කරණ අඩුපාඩු

2011 ජූලි සිට 2013 ජූනි දක්වා කාල පරිච්ඡේදය සඳහා සේවක භාරකාර අරමුදල් දායකය සාවද්‍ය ලෙස ගණනය කර තිබූ අතර එහි ප්‍රතිඵලයක් ලෙස රු.395,432 ක මුදලක් මූල්‍ය ප්‍රකාශනවල වැඩියෙන් දක්වා තිබුණි.

## 5.2 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම්

පහත සඳහන් අනුකූල නොවීම් අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

(අ) 2012 නොවැම්බර් සිට 2013 අප්‍රේල් දක්වා කාල පරිච්ඡේදය සඳහා ව්‍යාපෘතියේ නිලධාරීන් තිදෙනෙකුගේ වැටුප්වලින් අයකළ යුතු උපයන විට ගෙවීම් බදු අයකර දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයාට ප්‍රේෂණය කර නොතිබුණි.

(ආ) 2013 ජූලි මාසයේදී අනතුරකට භාජනය වූ මන්නාරම දිස්ත්‍රික් ව්‍යාපෘති කාර්යාලයට අනුයුක්ත මෝටර් වාහනයට සිදුවූ අලාභය පිළිබඳ මුදල් රෙගුලාසි 104(4) ප්‍රකාර වාර්තා 2014 මාර්තු 31 වන විටත් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ඇ) එකතුව රු.10,220 ක් වූ දේශීය බදු ව්‍යාපෘති කාර්යයන් සඳහා ලැබුණු විදේශ ප්‍රදාන මුදල්වලින් සාවද්‍ය ලෙස අයකර තිබුණි.

(ඈ) දිස්ත්‍රික් කාර්යාල 5 ක ජංගම නොවන වත්කම් පිළිබඳව සමාලෝචිත වර්ෂය සඳහා මුදල් රෙගුලාසි 756 ප්‍රකාරව වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය පවත්වා නොතිබුණි.

## 6. මූල්‍ය හා භෞතික කාර්ය සාධනය

### 6.1 අරමුදල් උපයෝජනය

ලැබී ඇති තොරතුරු අනුව, සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍යයනය හා අයවැයගත ප්‍රතිපාදන, සමාලෝචිත වර්ෂය තුළ අරමුදල් උපයෝජනය සහ 2013 දෙසැම්බර් 31 දිනට සමුච්චිත උපයෝජනය පිළිබඳ වැදගත් සංඛ්‍යා ලේඛන කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | සැපයීම සඳහා එකඟවූ මුදල | | 2013 වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදන | වර්ෂය තුළ උපයෝජනය කළ අරමුදල් | 2013 දෙසැම්බර් 31 දක්වා උපයෝජනය කළ අරමුදල් | |
|---|---|---|---|---|---|---|
| | එජඩො මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | එජඩො මිලියන | රු.මිලියන |
| ආ ස බැ | 2.50 | 320.90 | 136.00 | 135.86 | 2.21 | 283.82 |
| ශ්‍රී ලං ර | 0.15 | 19.20 | 9.00 | 4.97 | 0.03 | 4.97 |
| එකතුව | **2.65** | **340.10** | **145.00** | **140.83** | **2.24** | **288.79** |

### 6.2 භෞතික කාර්ය සාධනය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ව්‍යාපෘති පරිපාලන අත් පොතෙහි 15 ඡේදය ප්‍රකාරව ව්‍යාපෘති කාර්යයන් නියාමනය කිරීම සඳහා පැවැත්විය යුතු මාසික ව්‍යාපෘති සම්බන්ධීකරණ කමිටු රැස්වීම් පවත්වා නොතිබුණි.

(ආ) ඉටුකර ගත යුතු ඉලක්කයන් සමඟ ප්‍රධාන කාර්ය මණ්ඩලයේ වගකීම් හඳුනා ගැනීමට හා සමාලෝචිත වර්ෂය තුළ සිදුකළ යුතු කාර්යයන් සම්බන්ධයෙන් අයවැය වෙන්කිරීම් හඳුනා ගැනීම සඳහා ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. එබැවින් සමස්තයක් වශයෙන් ව්‍යාපෘතියේ භෞතික ප්‍රගතිය විගණනයේදී විධිමත්ව ඇගයීමට නොහැකි විය.

(ඇ) ලැබී ඇති තොරතුරු අනුව, උතුරු පළාතේ දිස්ත්‍රික් 5 ක ව්‍යාපෘති කාල පරිච්ඡේදය තුළදී පුනරුත්ථාපනය කළ යුතු ඇල මාර්ග කිලෝ මීටර් 200 කින් කුඹුරු වාරි ඇල මාර්ග කිලෝ මීටර් 36.31 ක පුනරුත්ථාපන වැඩ පමණක් නිම කර තිබූ අතර අනෙකුත් ඇල මාර්ග කිලෝ මීටර් 53.33 ක් 2013 දෙසැම්බර් 31 දිනට කෙරෙමින් පැවතුණි. එබැවින් ඉතිරි ව්‍යාපෘති කාල පරිච්ඡේදය තුළදී කිලෝ මීටර් 110.36 ක ඇල මාර්ගවල පුනරුත්ථාපන වැඩ නිම කිරීම සැක සහිතය.

(ඇ) ව්‍යාපෘති කාල පරිච්ඡේදය තුළදී නිම කිරීමට අපේක්ෂිත ග්‍රාමීය ප්‍රවේශ මාර්ග කිලෝ මීටර් 100 කින් 2013 දෙසැම්බර් 31 දිනට එම මාර්ග කිලෝමීටර් 28.98 ක මාර්ග වැඩිදියුණු කිරීම් පමණක් නිම කර තිබුණි. තවද ප්‍රදේශයේ ජනතාවගේ බොහෝ ඉල්ලීම් හේතුවෙන් වෙනත් මාර්ග කිලෝ මීටර් 518.3 ක් වැඩිදියුණු කිරීම සඳහා මූල්‍ය ප්‍රතිපාදන නොතිබියදීත් ව්‍යාපෘතිය විසින් එම වැඩිදියුණු කිරීම් සිදුකර තිබුණි. වාරි ඇල මාර්ග වැඩ ආරම්භ කර නොතිබීම නිසා ඒ සඳහා වෙන් කරන ලද අරමුදල් යොදා ගනිමින් ග්‍රාමීය ප්‍රවේශ මාර්ග බොහොමයක් පුනරුත්ථාපනය කිරීමට ව්‍යාපෘතියට සිදුවී තිබුණු බව ව්‍යාපෘති අධ්‍යක්ෂවරයා පැහැදිලි කර තිබුණි.

(ඉ) ස්වයං රැකියා සඳහා නිපුණතා සංවර්ධන පුහුණුව අවම වශයෙන් අභ්‍යන්තරිකව අවතැන්වූ පුද්ගලයින් 2,000 ක් වෙනුවෙන් සැපයීමට අපේක්ෂා කර තිබූ අතර 2013 දෙසැම්බර් 31 දිනට එයින් අභ්‍යන්තරිකව අවතැන්වූ පුද්ගලයින් 1,758 ක් සඳහා පමණක් පුහුණුවීම් ලබාදී තිබුණි. කෙසේ වුවද උතුරු පළාතේ දිස්ත්‍රික් 5 ක කෘෂිකර්මය, සත්ව පාලනය, ඇඳුම් මැසීම හා පරිගණක පුහුණුව පිළිබඳ පුහුණු මාදිලි සංවර්ධනය කර ක්‍රියාත්මක කර නොතිබුණි.

**6.8 වත්කම් කළමනාකරණය**
**-----------------------------**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ව්‍යාපෘතිය විසින් එහි ආරම්භයේදී රු.3,962,941 ක් වටිනා ස්ථාවර වත්කම් ප්‍රසම්පාදනය කර තිබුණද, 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය ප්‍රකාරව ස්ථාවර වත්කම් ලේඛනයක් විධිමත්ව පවත්වා නොතිබුණි. තවද දිස්ත්‍රික් ශාඛා 5 ක ස්ථාවර වත්කම් පිළිබඳ භාණ්ඩ සමීක්ෂණ පවත්වා නොතිබුණි. එබැවින් ව්‍යාපෘතියේ ස්ථාවර වත්කම්වල භෞතික පැවැත්ම විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යෙක්ෂණය කළ නොහැකි විය.

(ආ) යාපනය දිස්ත්‍රික්කයේ සත්ව පාලන පුහුණු වැඩ සටහනක් පැවැත්වීම සඳහා 2013 ජූලි 16 දින රු.500,000 ක අත්තිකාරමක් යාපනය දිස්ත්‍රික් ලේකම්ට ගෙවා තිබුණි. පසුව එම රු.500,000 ක් වූ අත්තිකාරම අරමුණු කළ කාර්යය සඳහා යොදා ගැනීමෙන් තොරව 2013 සැප්තැම්බර් 11 දින සම්පූර්ණයෙන් නිරවුල් කර තිබුණි.

(ඇ) 2011 ජූලි සිට 2013 ජූනි දක්වා කාල පරිච්ඡේදය සඳහා සේවක අර්ථ සාධක අරමුදලේ හිඟ දායක මුදල් මත අධිභාර එකතුව රු.927,862 ක් ව්‍යාපෘතිය විසින් ගෙවා තිබුණි.

**6.4** **මානව සම්පත් කළමනාකරණය**

**------------------------------------**

2007 අප්‍රේල් 05 දිනැති අංක 33 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය ප්‍රකාරව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත නොකරන ලද තනතුරු 21 ක් සඳහා ව්‍යාපෘතිය විසින් නිලධාරින් සේවයේ යොදවා තිබුණි. තවද එකී චක්‍රලේඛයේ 2.2.8 ඡේදයේ උපදෙස්වලට පටහැනිව වෙනත් නිලධාරින් දෙදෙනෙකු ද පත් කර තිබුණි.